# ප්‍රවෘත්ති නිවේදනය
# PRESS RELEASE

සෞඛ්‍ය අමාත්‍යාංශය | சுகாதார அமைச்சு | Ministry of Health

Telephone Office: 2671181 / Gen: 2694033 / 2669192 / 2675011 / 2675449 / Fax: 2689540

**2021.08.31**

ප්‍රධාන කතෘ - පුවත්පත්
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ -ගුවන්විදුලි / රූපවාහිනී
සංස්කාරක වෙබ් පුවත්,

**දිස්ත්‍රික් මට්ටමින් එන්නත්කරණය වඩාත් කඩිනම් කරන්න -**

**සෞඛ්‍ය ඇමතිගෙන් උපදෙස්**

දිස්ත්‍රික් මට්ටමින් මේ වන විට සිදු කෙරෙන එන්නත්කරණ කටයුතු ඉතා කඩිනම් කරන ලෙස සෞඛ්‍ය අමාත්‍ය ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා අමාත්‍යාංශ නිලධාරීන්ට ඊයේ (30) පස්වරුවේ උපදෙස් ලබා දුන්නේය.

ඒ අනුව වයස අවුරුදු 30-60 ත් අතර කාණ්ඩය මෙන්ම අවුරුදු 60 ඉක්මවූ පිරිස් සඳහා ලබාදෙන එන්නත් ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශ මට්ටමින් ලබා දීම ඒ ඒ දිස්ත්‍රික්කයන්හි උපරිම විධිමත් අයුරින් කරන ලෙස අමාත්‍යවරයා මෙහිදී ඉල්ලා සිටියේය.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෛද්‍ය සංජීව මුණසිංහ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන , වසංගත රෝග විද්‍යා ඒකකයේ අධ්‍යක්ෂ වෛද්‍ය සමිත ගිනිගේ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මහජන සෞඛ්‍ය සේවා) වෛද්‍ය එම්.ආනල්ඩ් යන මහත්වරුන්ගේ සහභාගිත්වයෙන් මෙම සාකච්ඡාව පැවැත්විණි.

මේ වන විට දෙවන මාත්‍රාව ලබා දීම බොහෝ සෙයින් කෙරෙන අතර එය නියමිත දිනට නියමිත ස්ථානයේම නිසි අයුරින් ලබාදීමට හැකි සෑම පියවරක්ම ගන්නා ලෙස අමාත්‍යවරයා ඉල්ලා සිටියේය.

ඇතැම් දිස්ත්‍රික්කයන්ගෙන් ලැබෙන විවිධ පැමිණිලි සැලකිල්ලට ගෙන ඒ පිළිබඳව සොයා බලා කටයුතු කරන ලෙසත්,මේ සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්,පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂවරුන් හා ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් අතර මනා සබඳතාවක් පවත්වාගෙන යා යුතු බව අමාත්‍යවරයා මෙහිදී පෙන්වා දුන්නේය.

එළඹෙන මුල් සතියේ එන්නත් මිලියන 04 ක් ලැබීමට නියමිත අතර එමගින් අවුරුදු 30 ඉක්මවූ පිරිස් සඳහා ලබාදෙන එන්නත්කරණය පූර්ණ ලෙස අවසන් කිරීමට හැකිවනු ඇතැයි සෞඛ්‍ය නිලධාරීන් මෙහිදී විශ්වාසය පළ කළහ.


ඉන්දික පොල්කොටුව
ගරු අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම්
0714161168 / 0777270026
සෞඛ්‍ය අමාත්‍යාංශය